# දෙබිඩි උගත්තු

අප අද වැටී ඇති තත්වය පිළිබඳ තරමක විස්තරයක් පසුගිය ලිපි කිහිපයෙහි අඩංගු වෙයි. විශේෂයෙන් ම අද භික්ෂූන් වහන්සේගේ තත්වය ඉතා කණගාටුදායක ය. උන්වහන්සේට අද රටේ සැලකිය යුතු මට්ටමක නායකත්වයක් නැත. එහෙත් තවමත් සිංහල බෞද්ධයෝ උන්වහන්සේට ගරු කරති. එසේ වුවත් ඒ කොපමණ කාලයකට දැයි නිශ්චිතව කිවහැකි නො වෙයි. අවාසනාවකට පසුගිය අවුරුදු පන්සියයක පමණ කාලයක සිදු වු මේ පරිහාණිය පිළිබඳ ව බොහෝ දෙනකුට අවබෝධයක් නැත. විශේෂයෙන් ම යම් දේශපාලන නිදහසක් ලැබීමෙන් පසුව පසුගිය අවුරුදු හැටකට ආසන්නයේ සිදු වී ඇති පරිහාණිය බොහෝ දෙනකුට නො පෙනෙයි.

මෙයට ප්‍රධාන හේතුව ඊනියා නිදහසින් පසුව බටහිර යටත්විජිතවාදයේ ප්‍රධාන සංරචකය දේශපාලනයෙන් ආර්ථිකයටත් පසුව සංස්කෘතියටත් මාරුවීම ය. මෙයින් අදහස් කරන්නේ බටහිර සංස්කෘතික යටත්විජිතවාදය නිදහසට පෙර නොතිබිණිය යන්න හෝ වර්තමානයෙහි දේශපාලන යටත්විජිතවාදයක් නැතැයි යන්න හෝ නො වෙයි. ඒ ඒ සංරචකයට ඇති වැදගත්කම කලින් කලට වෙනස් වී ඇත. අද අප පෙළීමට විශේෂයෙන් ම යොදා ගැනෙනුයේ සංස්කෘතික යටත්විහිතවාදය ය. එයට අමතර ව ආර්ථික සංරචකය ද යොදා ගැනෙයි.

මෙය අප රටට පමණක් විශේෂිත වුවක් නො වෙයි. ආසියාවේ, අප්‍රිකාවේ හා දකුණු ඇමෙරිකාවේ සියළු රටවල මේ තත්වය අඩුවැඩි වශයෙන් දැකගත හැකි ය. අද චීනය හා ඉන්දියාව ආර්ථික වශයෙන් විශාල දියුණුවක් අත්කර ගනිමින් ඇතැයි කියැවෙයි. එහෙත් ඒ රටවල් අත්කර ගනිමින් සිටින්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආර්ථික දියුණුවක් බව බොහෝ දෙනාට තේරුම් ගැනීමට නොව කල්පනා කිරීමටවත් නො හැකි ය. අද අපේ රටවල උගතුන්ට කල්පනාකිරීමට සිදු වී ඇත්තේ බටහිර සංස්කෘතියේ නිපදවෙන හා නිපදවනු ලැබූ දැනුම උපයෝගී කරගෙන ය. එවැනි උගතුන් ඉන්දියාවේ හා චීනයේ ආර්ථික දියුණුව වාස්තවික ආර්ථික දියුණුවක් ලෙස මිස බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දියුණුවක් ලෙස දකින්නේ කෙසේ ද?

පාසල හා විශ්වවිද්‍යාලය ඔස්සේ සිදු වූ සංස්කෘතික යටත්විජිතවාදයට වඩා ගුණ කිහිපයකින් වැඩි සංස්කෘතික යටත්විජදතවාදයක් මාධ්‍ය, විශේෂයෙන් ම විද්‍යුත් මාධ්‍ය, ඉනුත් රූපවාහිණී මාධ්‍යය හා අද අන්තර්ජාලය ඔස්සේ ක්‍රියාත්මක වෙයි. තොරතෝංචියක් නැතිව කෙළින් ම නිවසට ගලා එන මේ දැනුම සමග අප සටන්කරන්නේ කෙසේ ද? මේ දුනුම හේතුකොටගෙන, ඒ විචාරයකින් තොරව ලබාගැනීමෙන්, අප තව තවත් දීනයන් වන බව බොහෝ දෙනකුට නො තේරෙයි. අපේ රටේ ද අප වැනි අනෙක් රටවල ද තත්වය එසේ ය.

අප රටේ හා ජාතියේ මුරදේවතාවුන් වහන්සේ පමණක් නොව ගුරුවරුන් ද වූ භික්ෂූන් වහන්සේ අපට යම් දේශපාලන නිදහසක් ලැබෙන තෙක් සෙමින් ද ඒ නිදහසෙන් පසුව ඉතා වේගයෙන් ද එකී තත්වයෙන් පහකිරීමට කටයුතු කෙරුණේ හා කෙරෙන්නේ සංස්කෘතික යටත්විජිතවාදය විසිනි. සංස්කෘතික යටත්විජිතවාදයේ ප්‍රතිඵල ලෙස අපට ලැබුණු දැනුම අපට අවශ්‍ය අන්දමින් හසුරුවා ගැනීමට අපි නො දත්තෙමු. අවාසනාවකට භික්ෂූන් වහන්සේට ද ඒ පිළිබඳ ව කළ යුත්තේ කුමක් ද යන්න ගැන අවබෝධයක් නො වී ය.

සංස්කෘතික යටත්විජිතවාදය යන්න තේරුම් නොගත් උගත්තු ඒ සම්බන්ධයෙන් දෙබිඩි පිළිවෙතක් අනුගමනය කළහ. අද ද ඔවුන් ඒ දෙබිඩි පිළිවෙත අනුගමනය කරනු දැකිය හැකි ය. එහි එක් පැත්තකින් වූයේ අපේ පැරණි සංස්කෘතියට ගරුකිරීම ය. පැරණී සංස්කෘතිය ගැන කතාකිරීමට එහි අනර්ඝභාවය අගය කිරීමට අපේ ඇතැම් උගත්තු පෙරට පැමිණියහ. බටහිර සංස්කෘතික යටත්විජිතවාදයේ ඉහළ ම සේවකයන් පැරණි සංස්කෘතියට ගරහද්දී උගතුන් පිරිසක් ඒ ගැරහීමට ප්‍රතිචාර දැක්වූයේ එලෙස පැරණී සංස්කෘතිය අගය කරමිනි.

ඉන්දියාවේ දී මැකෝලී සාමිවරයා පවසා ඇත්තේ පැරණි භාරතීය පොතපත සියල්ල අල්මාරි දෙකක තැන්පත් කළ හැකිය යන්න ය. ලංකා විශ්වවිද්‍යාලයේ පළමු උපකුලපතිවරයා වූ අයිවෝර් ජෙනිංග්ස් මහතා කියා ඇත්තේ ලංකාව සංස්කෘතික කාන්තාරයක් බව ය. මේ කියමනේ සත්‍යාසත්‍යතාව පිළිබඳ අද උගත්තු විවිධ මත පළ කරති. ජෙනිංග්ස්

© Prof. Nalin De Silva

මහතා ඒ ප්‍රකාශය කෙළේ කොළඹ කාන්තා විද්‍යාලයේ ත්‍යාග ප්‍රදානෝත්සවයක දී යැයි කියැවෙයි. ඒ එසේ නම් ජෙනිංග්ස් මහතා එලෙස කී බව හෝ නොකී බව හෝ සනාථ කර ගැනීම අපහසු කාර්යයක් නොවනු ඇත. අනෙක් අතට ඒ බව කියා ඇත්තේ වෙනත් තැනක දී නම් ඒ බව දැනගැනීමට ද එතරම් අපහසු නො විය යුතු ය. එහෙත් ප්‍රශ්නය වනුයේ හෙනිංග්ස් මහතා එලෙස කියා නැත්නම් ඒ බව සනාථ කරන්නේ කෙසේ ද යන්න ය. ජෙනිංග්ස් මහතා එසේ කී බවට සාක්ෂි ඉදිරිපත් කිරීමට නොහැකි වූ පමණින් එවැනි ප්‍රකාශයක් කර නැතැයි නිගමනය කළ නො හැකි ය. යමකු යමක් නොකළ බව සනාථකිරීම කළ නොහැක්කකි!

ජෙනිංග්ස් මහතා එසේ කීවත් නැතත් අපට වැදගත් වන්නේ මෙරට සංස්කෘතිය ඉගැන්වීම පිළිබඳ ඒ මහතා දැරූ අදහස් ය. ඔහු පැහැදිලිව ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සේවකයෙක් විය. ඔහු මෙරටට පැමිණියේ බටහිර මාදිලියේ විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට මිස මහාවිහාරයක් අභයගිරියක් නාලන්දාවක් හෝ තක්ෂිලාවක් හෝ ඇරඹීමට නො වෙයි. ඔහු විශ්වවිද්‍යාලයේ ආයුර්වේදය හෝ සිංහල වෙදකම හෝ ඉගැන්වීමට කිසිදු උත්සාහයක් දරා නැත. ඔහු අපේ දැනුමට ගරු කෙළේ යැයි මොහොතකට සිතමු. එසේ වුවත් ඒ දැනුම විශ්වවිද්‍යාලයෙහි ඉගැන්වීමට තරම් සුදුසු යැයි ඒ මහතා සිතා නොමැති බව පැහැදිලි ය.

අපේ නිමැවුම් ගැන ගරුත්වයක් දැක්වූ විදේශිකයන් සිටියත් ඔවුන් .ඒ පැරණි දැනුමක් ලෙස පමණක් සලකා ඇති බව අපට පෙනී යයි. අනෙක් අතට බොහෝ යටත්විජිතවාදීන්ට ඒ දැනුම් හා නිමැවුම් ගැන කතාකිරීමට තරම්වත් දෙයක් තිබී නැත. ඔවුහු එදෙස අවඥාවෙන් බැලූහ. අපේ උගතුන් බොහෝ දෙනා දෙබිසි පිළිවෙතක් අනුගමනය කර ඇත්තේ මෙවැනි ක්‍රියාමාර්ගයක් මැද ය. ඔවුන් අනුගමනය කළ දෙබිඩි පිළිවෙත අපේ නිමැවුම් ගැන ගරුත්වයක් ඇතිව සිටි විදේශිකයන්ගේ පිළිවෙතින් එතරම් වෙනස් නො වී ය.

අපේ සමහර උගත්තු ද අර විදේශිකයන් මෙන් ම අපේ ඊනියා පැරණි දැනුම් නිමැවුම් ආදිය ගැන ගරුත්වයෙන් කතා කළහ. එයට අමතරව ඔවුහු ඒ පිළිබඳ ආඩම්බරයක් ද ඇති කර ගත්හ. විදේශිකයන්ගෙන් අපේ ඒ උගතුන් වෙනස් වූයේ නම් ඒ ආඩම්බරය හේතුකොටගෙන විය. එයට අමතර ව අපේ උගතුන් ද නව දැනුම ලෙස සැලකුවේ බටහිර දැනුම ය. බටහිර දැනුම හැරෙන්නට වෙනත් නව දැනුමක් ගැන සිතීමට ඔවුන්ට නො හැකි විය. එබැවින් පාසල්වල හා විශ්වවිද්‍යාලවල ඉගැන්විය යුතු නව දැනුම ලෙස ඔවුන් සැලකුවේ බටහිර දැනුම ය. අපේ දැනුම ඉගැන්විය යුතු යැයි කී උගතා ද එසේ කීවේ ඒ පැරණි සම්භාව්‍ය දැනුමක් ලෙස සලකා මිස දැනුමක් ලෙස සලකා නො වෙයි.

මෙය දෙබිඩි පිළිවෙතක් නොවේ යැයි බොහෝ දෙනකු සිතෙනු ඇත. එසේ අපේ දැනුම පැරණි දැනුමක් ලෙසත් බටහිර දැනුම නූතන දැනුම ලෙසත් උගන්වනු හැරෙන්නට කළ හැක්කේ කුමක් දැයි ඔවුන් සමහර විට ප්‍රශ්න කිරීමට ද ඉඩ ඇත. අපේ උගතුන්ට කළ හැකි ව තිබූ කාර්යයක් විය. එනම් අඩුම තරමින් දැනුම බටහිර දැනුම හා පෙරදිග දැනුම, අවශ්‍ය නම් අපේ දැනුම ආදී වශයෙන් වර්ග කර ඉගැන්වීම ය. එහෙත් අපේ උගතුන්ට එවැනි දැක්මක් නො වී ය. ඔවුන්ට තිබුණේ අර ඇතැම් විජාතිකයන්ට තිබූ ආකල්ප ම ය. ඇතැම් විට අපේ උගතුන් ඒ ආකල්ප ඒ විජාතිකයන්ගෙන් ම ලබාගත්තා විය හැකි ය.

බොහෝ කලකින් අපේ යැයි කිවහැකි දැනුමක් නිර්මාණය වී නැති බව සැබෑ ය. එහෙත් එපමණකින් අපේ දැනුම හුදු පැරණි දැනුමක් එසේත් නැත්නම් සාම්ප්‍රදායික දැනුමක් ආදි වශයෙන් බටහිරයන් වර්ග කරද්දී අපේ උගතුන් නිහඬ නොවිය යුතු ව තිබුණි. බටහිරයන් අපේ දැනුම ගැන සඳහන් කෙරිණි නම් ඒ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශවල හා සිංහල, පාලි, සංස්කෘත ආදී අධ්‍යයන අංශවල විය. ඒ ඉගැන්වූයේ ඓතිහාසික දැනුමක් ලෙස මිස නව දැනුමක් ලෙස නො වෙයි. මෙහි දී විදේශිකයන් අභිබවා යෑමට අපට ශක්තියක් නො වී ය. අපේ උගතුන්ගේ දෙබිඩි බව වූයේ ඔවුන් අපේ දැනුම ගැන ගෞරවයෙන් හා ආඩම්බරයෙන් කතාකරන අතර ම ඒ පැරණි දැනුමක් ලෙස පමණක් සැලකීමෙහි ය. අපේ දැනුම වර්තමානයට ද අදාළ දැනුමක් කරගන්නේ කෙසේ දැයි ඔවුන් නොදැන සිටියා පමණක් නොව ඔවුන්ට ඒ ගැන සැලකීමක් පවා නො වී ය. ඔවුන්ට වත්මන් දැනුම වූයේ බටහිර දැනුම ය.

බොහෝ දෙනකු එකඟ නොවුණ ද මේ දෙබිඩි ස්වභාවය පිළිබඳ හොඳම උදාහරණය මාර්ටින් වික්‍රමසිංහ මහතා ය. අපේ දැනුම වර්තමානයේ දැනුමක් ලෙස සිතීමට ඒ මහතාට නො හැකි විය. ඔහු බටහිර විද්‍යාව ඉතා ඉහළින්

© Prof. Nalin De Silva

සැලකුවේ ය. බටහිර කෙටිකතාව හා නවකතාව ඉහළින් ම අගය කෙළේ ය. ඔහුට තේරුණ ප්‍රමාණයට ඔහු බටහිර දර්ශනයට සැලකී ය. ඔහු ලංකා විශ්වවිද්‍යාලයෙහි එවකට බටහිර මානව විද්‍යාව (Anthropology) නුගැන්වී යැයි අයිවෝර් ජෙනිංග්ස් මහතා විවේචනය කරමින් ලිපි ලිවී ය. බටහිර මානව විද්‍යාව නිර්මාණය කෙරෙන්නේ බටහිරයන්ගේ මතිමතාන්තර යොදා ගනිමින් බටහිර මිනිසා පෙරදිග මිනිසාට වඩා වර්ධනය වී ඇති බව පෙන්වීමට බව මාර්ටින් වික්‍රමසිංහ මහතාට මිය යන තුරුම නොතේරෙන්නට ඇත.

ඇතැම් උගතුන්ගේ ඒ දෙබිඩි ස්වරූපය අවසානයේ දී අපේ දැනුම, එනම් ඔවුන්ට අනුව පැරණි දැනුම, බටහිර දැනුමට සමාන බව හෝ අනුරූප බව හෝ පෙන්වා දීම කරා යොමු විණි.  එක්තරා ආකාරයකට ගත්විට ඉන් දෙබිඩි ස්වරූපය නැතිකිරීමක් අවිඥානික ව හෝ බලාපොරොත්තු විණි යැයි කිසිවකුට කිව හැකි ය. ඔවුන්ට අනුව අපේ පැරණි දැනුම හා වත්මන් වටහිර දැනුම අතර සම්බන්ධයක් විය. ඒ සම්බන්ධය අන් කිසිවක් නොව ඔවුන් කී ආකාරයට බටහිර දැනුම අපේ පැරණි දැනුමෙහි ද තිබීම ය. බටහිර කෙටිකතාව හා නවකතාව අපේ ජාතක කතාවෙහි දැකීමට ඔවුන් යොමු වුයේ එලෙස ය. එසේත් නැතහොත් ඇතැමුන් බුදුදහම විද්‍යාත්මක, එනම් බටහිර විද්‍යාත්මක යැයි කීමට පෙළඹුණේ ඒ ආකාරයට ය. ඔවුන් හැදින් වූ අන්දමට අපේ පැරණි දැනුම හා බටහිර වත්මන් දැනුම අත රඑවැනි සම්බන්ධයක් තිබී නම් ඉන් අඩුම තරමින් කරුණු දෙකක් ඉටු වී යැයි තර්ක කළහැකි විය. පළමුව කලින් කී අයුරින් දෙබිඩි ස්වරූපය නැති වී යැයි කිසිවකුට කිවහැකි විය. දෙවනුව අපේ දැනුම ද බටහිර දැනුමට නොදෙවෙනි යැටි කියා සිත සනසා ගැනීමක් ද එහි විය. එහෙත් ඒ උගතුන්ගේ අවාසනාවකට අපේ දැනුම හා බටහිර දැනුම අතර එවැනි සම්බන්ධයක් නො වී ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva